# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,301 — 1965 ජනවාරි 23 වැනි සෙනසුරාද — 1965.1.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.–බී. 23/63

### 1963 අංක 11 දරන මුදල් පනත

58(4) (උ) වගන්තිය යටතේ වූ ආඥාව

1963 අංක 11 දරන මුදල් පනතෙහි 58 වන් වගන්තියෙහි (4) (උ) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති, නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා, වන මම මෙහි උපලේඛනයෙහි දක්වා ඇති දේපළෙහි වර්ගය හෝ විස්තරය ඉහත කී වගන්තියේ (1), (2) හා (3) වන උපවගන්තිවල කාර්‍ය්‍යයන් සඳහා මේ ආඥාවෙන් නිශ්චිත ව සඳහන් කරමි.

1965 ජනවාරි මස 21 වන දින,
කොළඹ දී ය.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

#### උපලේඛනය

පිළිගත් ව්‍යාපාරයක් පවත්වාගෙන යන තැනැත්තකු වෙත පවරන ලද්ද වූ ද, ඒ තැනැත්තා විසින් ඒ ව්‍යාපාරයට සම්බන්ධ වූ කර්මාන්ත ශාලාවක් හෝ ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් සේවයෙහි යොදවා ඇති අන් කිසි තැනැත්තකුගේ පාවිච්චිය සඳහා නැතහොත් ඔහුගේ පදිංචිය පිණිස ගෙයක් ඒ දේපළෙහි තැනීමේ කාර්‍ය්‍යය සඳහා ඒ තැනැත්තා විසින් ප්‍රයෝජනයට ගනු ලැබීමට නියමිත වූ ද යම් දේපළක්.

මේ උපලේඛනයෙහි—

"පිළිගත් ව්‍යාපාරය" යන්නෙන් කර්මාන්ත පිළිබඳ විෂය හෝ කාර්‍ය්‍යය භාරව සිටින ඇමතිවරයාගේ එකඟත්වය ඇති ව මුදල් ඇමතිවරයා විසින් පිළිගනු ලබන යම් ව්‍යාපාරයක් අදහස් වේ; තවද

"කර්මාන්ත ශාලාව" යන්නට වැඩ පොළක් සහ එයට අයත් භූමිභාගය ඇතුළත් වේ.

1—1000

---

### මිළ පාලන පනත

පහත සඳහන් උපලේඛනයේ දක්වෙන නියෝග මවිසින් අනුමත කරනු ලැබූ බව (173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 4 වැනි වගන්තියේ 7 වැනි උපවගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු ඇමති.

1965 ජනවාරි 22 දින,
කොළඹ දීය.

#### උපලේඛනය

| නියෝගයේ දිනය | නියෝගය නිකුත්කළ නිලධාරි | නියෝගය අදාල ද්‍රව්‍යය | නියෝගය පලකරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 1964.12. 3 | මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය නියෝජ්‍ය (ආහාර) මිල පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය | 1964.12. 7 දින අංක 14,251 |
| 1964.12. 8 | මිල පාලක (ආහාර) | එම | 1964.12. 9 දින අංක 14,253 |
| 1964.12. 9 | නියෝජ්‍ය මිල පාලක (ආහාර) මඩකලපු දිස්ත්‍රික්කය | එම | 1964.12.12 දින අංක 14,256 |
| 1964.12. 8 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක | එම | එම |
| 1964.12. 5 | මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක | එම (මයිසූර් පරිප්පු) | එම |
| එම | එම | සක්කරා (එකතුකළ යුතු නිත්‍ය මිලක් නියම කිරීම) | එම |
| 1964.12.11 | වවුනියා දිසාවේ සහකාර මිල (ආහාර) පාලක | සක්කරා | 1964.12.17 දින අංක 14,260 |
| 1964.12.15 | ගාලු දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක (ආහාර) | අතිරේක ආහාර ද්‍රව්‍ය | 1964.12.24 දින අංක 14,266 |
| 1964.12.17 | මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක තැන | තිරිඟු පිටි | එම |
| එම | එම | පාන් | එම |
| එම | එම | සහල් | එම |
| 1964.12.19 | සහකාර මිල පාලක (ආහාර) කොළඹ දිස්ත්‍රික්කය | අතිරේක ආහාර ද්‍රව්‍ය | එම |

1–1050

127—ආර් 3177—8,181 (65/1)

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 2/65 දරන ආනයන පාලන දැන්වීම

### ඇවරණු විෂය අංක

පහත 1 උපලේඛනයේ (1) තීරයෙහි දක්වෙන බඩු, උපලේඛනයේ (2) තීරයේ පෙන්නා ඇති සංස්ථා විසින් ආනයනය කරනු ලැබීම වස් මුළුමනින්ම ඇවිරෙන බව ආනයනකයින් වෙත මෙයින් දන්වනු ලැබේ. මෙම බඩු ආනයනය කිරීම වස් අන්‍යයන් වෙත බලපත්‍ර නිකුත් නො කෙරේ.

2. සමූපකාර තොග වෙළෙඳ ආයතනය විසින් ආනයනය කරනු ලැබීම වස් මුළුමනින්ම ඇවිරෙන බඩු සම්බන්ධයෙන් වැඩිදුර දැන්වීමක් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඊ. එම්. විජේනායක,
ආනයන හා අපනයන පාලක.

කොළඹ, 1965 ජනවාරි 18.

### 1 උපලේඛනය

| | තීරය (1) | තීරය (2) |
|---|---|---|
| 1. | පුවත් කඩදසි ... ... ... ... | පෙරදිග කඩදසි කර්මාන්තශාලා සංස්ථාව |
| 2. | පුවත් කඩදසි නොවන කඩදාසි ... ... ... | එම |
| 3. | කඩදාසි පුවරු ... ... ... ... | එම |
| 4. | කපු නූ ... ... ... ... ... | ජාතික ජේෂකර්ම සංස්ථාව |
| 5. | සිමෙන්ති ... ... ... ... | ලංකා සිමෙන්ති සංස්ථාව |
| 6. | සතුන්ට කන්ට දෙන ද්‍රව්‍ය (නොඇඹරූ ධාන්‍ය සහ පොල් පුන්නක්කු ඇතුළත් නැත) ... ... ... ... ... | ලංකා තෙල් සහ මේද සංස්ථාව |
| 7. | ඉරිඟු ... ... ... ... ... | එම |
| 8. | පැට්‍රෝල් (නැව්වලට සහ ගුවන් සේවයට සැපයීම සඳහා නොවන) ... | ලංකා ඛනිජ තෙල් සංස්ථාව |
| 9. | ස්නේහක තෙල් සහ ග්‍රීස්, සත්ව සහ ශාක ස්නේහක සහිත මිශ්‍රණ ඇතුළුව (නැව්වලට සහ ගුවන් සේවයට සැපයීම සඳහා නොවන) ... ... | එම |
| 10. | කොස්ටික් සෝඩා ... ... ... ... | පරන්තන් රසායනික ද්‍රව්‍ය සංස්ථාව |

1–1053

---

## රේගු නිවේදනය අංක 61/9/165

ආදයම් රක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1965 ජනවාරි මස 25 වෙනි සඳු දිනෙන් ආරම්භවන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර, අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. | ශ. |
|---|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... | 1 | 10 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 | 09 |

ඩබ්ලිව්. පත්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක : ඊ 781,
1965 ජනවාරි මස 23 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1–1051

---

## රේගු දැන්වීම අංක 64/5/25

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වෙනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත් 1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 ජනවාරි මස 25 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොලෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 218 4/5 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 295 22 | 292 86 | 248 73 | 73 80 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන් කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

ඩබ්ලිව්. පත්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක : ඊ 744/22.
1965 ජනවාරි මස 23 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1–1052

---

ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි